විජයබා කොල්ලය නම් වූ
වජ්‍ර පුස්තකය

අප මහත් වූ ආශාවකින් (හා බයෙන් බයෙන්) බලා සිටින්නේ 'විජයබා කොල්ලය' තිරයෙන් දැකගන්නට ය. එය දැවැන්ත සිනමා කෘතියක් විය යුතු යැයි අප උපකල්පනය කරන්නේ 'විජයබා කොල්ලය' නම් වූ නවකතාව කලකට පෙර අපට කළ බලපෑම අතිදැවැන්ත වන නිසා ය. විජයබා කොල්ලය, රූපරාමු හරහා නැරඹීම වූ කලී අපගේ අතීත සිහිනයක්, සුවඳ සිහිනයක් සැබෑවීමකි. ඒ නිසාම දෝ එය සිංහල නවකතාවේ 'මෞලි මංගල්‍යය' දැයි අපට සිතෙයි.

අප එසේ කියන්නේ මහගත්කරු මාර්ටින් වික්‍රමසිංහ සූරීන්ගේ තුන්ඇඳුනු නවකතාව - ගම්පෙරළිය, කලියුගය හා යුගාන්තය අපූර්වාකාරයෙන් සිනමාවට නැගූ ලෙස්ටර් ජේම්ස් පිරිස් නම් වූ මහා සිනමා වේදියාණන්ගේ ප්‍රයත්නය හැල්ලු කරන්නට නොවේ. එහෙත් ඊට හේතු යුක්ති සම්පාදනය කරන්නේ අපගේම අතීතයයි.

අවංකවම, හෘදයසාක්ෂියට එකඟවම කියන්නේ නම් නවකතා කියවීමේ උත්තේජනය අපට මුලින්ම ලබා දුන් නවකතාකරුවා වන්නේ ඩබ්ල්යු. ඒ. සිල්වා ය. බහතෝරන වියේදී අප ඇසූ කතන්දරවල ආහ්ලාදය වෙනස් මාත්‍රාවකින් අපට ලබාදුන්නේ ඔහු ය. ඩබ්ල්යු. ඒ. සිල්වාගේ නවකතා කුඩා දරුවන්ට මෙන් ම වැඩිහිටියන්ට ද එකසේ බලපෑම් නොකළේ නම් ඔහුට 'නවකතා චක්‍රවර්ති' නාමය හිමිවන්නේ ද නැත.

ලෝකයට හිත පිණිස ලෝකයේ පහළවන පුද්ගලයන් දෙදෙනෙකු ගැන අංගුත්තර නිකායේ දුක නිපාතයේ සඳහන් වෙයි. ඉන් එක් පුද්ගලයකු වන්නේ බුදුන් වහන්සේ ය. අනෙක් පුද්ගලයා සක්විති රජතුමා ය. බුදුන් වහන්සේ ආධ්‍යාත්මික ජයග්‍රහණයේ පරිසමාප්තිය වන අතර ලෞකික ජයග්‍රහණයේ පරිසමාප්තිය ලෙස සැලකෙන්නේ සක්විති රජතුමායි.

ඩබ්ල්යු. ඒ. සිල්වා නවකතා චක්‍රවර්තී ලෙස පිළිගැනුණේ ඔහුගේ නිර්මාණ පාඨක සිත්සතන් තුළ මවා පෑ ඒ පරිසමාප්ත අභූතපූර්ව ලෝකය හේතුවෙන් බව නිසැක ය. වර්තමානයේදී ද ඉඳහිට අප ඊට ළඟින් යන අත්දැකීමක් අත්විඳින්නේ විශාල වියදමක් දරා නිපද වූ දැවැන්ත බොලිවුඩ් චිත්‍රපටයක් හරහා ඊට සමවැදි සිටින හෝරා කිහිපයක් අතරේදී යැයි කීම වැරදි සහගත නොවේ. ඇතැම් වාණිජ චිත්‍රපට ද කලාත්මක චිත්‍රපට තරමට ම අපට, අපේ සිතුවිලිවලට බලපෑම් කරන අවස්ථා තිබේ.

විජයබා කොල්ලය සිනමාවට නැගීම යනු අතිදැවැන්ත කාර්යයක් වන බවය, අපගේ අදහස වන්නේ. ඒ මුළුමහත් නවකතාව පුරාම ඡේදනය වෙමින් ගලා යන සිද්ධි, අවස්ථා, ස්ථාන මෙන් ම ඒ ඓතිහාසික පරිසරය ද අතිශයින් සංකීර්ණ වන නිසා ය. මේ නිරූපණ සඳහා පරිගණක තාක්ෂණය වුව සෑහෙන්නේ දැයි ප්‍රශ්නයක් ද මතුවෙයි. ගම්පෙරළිය, කලියුගය හෝ යුගාන්තය සිනමාවට නැගීමේදී එතරම්ම සංකීර්ණ ලෙස විවිධ මානයන් කෙරෙහි සිත, නෙත හෝ කැමරාකාචය යොමු කිරීමට සිනමාකරුවාට සිදු වූයේ යැයි අපට නොසිතේ. (මේ අභියෝගය කවරාකාරයෙන් හෝ ජයගැනීමට සමත් වූවහොත් 'විජයබා කොල්ලය' චිත්‍රපටය සිංහල නවකතාවේ මෞලි මංගල්‍යය ලෙස නම් කිරීම වැරදි සහගත විය හැකි ද නැත)

ඩබ්ල්යු. ඒ. සිල්වාගේ නවකතා අපට සම්පාදනය කරන්නේ ආනන්දය පමණක් නොවේ. මනුෂ්‍යත්වය ගැඹුරු පතුලේ සැඟව ඇති උදාරත්වය ද ඔහු සිය චරිත ඔස්සේ විශද කරයි. එසේ කරන්නේ ප්‍රචාරකවාදීව ද නොවේ.

ලෝකයේ අංචක මිනිසුන්, යහපත් මිනිසුන් නැතහොත් හෘදය සාක්ෂියට අනුගතවීමට යම්කිසි උත්සාහයක් හෝ දරන මිනිසුන් දුර්ලභ වන බව සැබෑ ය. එහෙත් කලාතුරකින් දැකිය හැකි එවැනි මිනිසකුගේ භූමිකාවක් පොතක, රඟනළුවක චරිතයක් බවට පත්කිරීම අස්වාභාවික හෝ නොසිදු විය යුත්තක් හෝ නොවේ.

මේ වූ කලී නූතන සාහිත්‍යකරුවන් නිර්මාණකරුවන් බොහෝවිට අතගසන්නට මැලිවන ඉසවුවකි. ප්‍රශස්ත මට්ටමේ සාහිත්‍යකලා නිර්මාණවලින් වුව මෙකල බොහෝවිට සාකච්ඡා කෙරෙන්නේ ජීවිතයේ ජඩ පැත්ත පිළිබඳව ය. මිනිසාගේ නිර්දයභාවය, අශෝභනත්වය මතු කර දැක්වීම වඩා නූතනවාදී ප්‍රවේශයකැයි අංකුර නිර්මාණකරුවන් ද සිතා සිටින බවක් පෙනීයයි. යථාර්ථය එය යැයි තර්ක කළ හැකි වෙතත් මිනිසා යනු නපුරේ මෙන් ම යහපතේ ද සංකලනයකි. එහෙයින් මනුෂ්‍යත්වයේ, උදාරත්වය මතු කර දැක්වීම නූතනවාදී ප්‍රවේශයක් නොවේ යැයි කිසිවකුට කිව නොහැකි ය. මනුෂ්‍යත්වයේ නිසඟ ස්වභාවය සර්වකාලීන ය. සාර්වභෞමික ය.

'විජයබා කොල්ලය' නවකතාව හරහා සියුම් පණිවුඩ ගණනාවක් ඉසියුම් ලෙස සමාජගත වෙයි. රුදුරු ආඥාදායකයකු වන ද ලසර්දා පෘතුගීසි ජාතික ක්‍රිස්තියානි ආගමිකයකු බව පෙන්වා දෙන අතරේ පෘතුගීසි ජාතික ක්‍රිස්තියානිකාරයන් අතරේ ද සුදුමුදු, කාරුණික හදවත් වන බව මතක් කර දීම සඳහා කතුවරයා වරින් වරකුටිඤ්ඤා පියතුමා ද කරළියට ගෙන එයි.

දේවයන් වහන්ස, මෙතුමා අපේ හාමුදුරුවන් වහන්සේ නමකට ද වඩා හොඳ බෞද්ධයෙකැ යි මහරජතුමාට පියතුමා හඳුන්වාදෙමින් වරක් අසංගයන් පවසන්නේ ඒ අනුව ය.

කුටිඤ්ඤා පියතුමා ඊට පිළිතුරු සපයන්නේ මෙසේ ය.

> අහෝ රජ්ජුරුවෙනි, පරංගියකු සැටියෙන් ගෙන මට නින්දා කළ මැනවි. ඒ නින්දාව මම ඉතා සතුටින් ඉවසන්නෙමි. එහෙත් ක්‍රිස්තියානු පැවිද්දකු සැටියෙන් ගෙන මට නින්දා නොකළ මැනවි

ඩබ්ල්යු. ඒ. සිල්වා සූරීන්ගේ නවකතාවලින් ඉස්මතු වූ උදාර චරිත අතරේ විශේෂ තැනක් හිමිවන්නේ විජයබා කොල්ලය නවකතාවේ එන අසංගට හා කුටිඤ්ඤා පියතුමාට ය. සැබැවින්ම මිනිසුන් අතරේ විරළව දකින්නට ලැබෙන ඒ උත්තර මිනිසා අපට මතක සිටින අයුරින්, තද පාටින් සිතුවම් කර දුන්නේ ද ඩබ්ල්යු ඒ සිල්වා ය. ඒ උත්තර මිනිසා අපට මුලින්ම මුණගැස්සූ විදේශීය ලේඛකයා වන්නේ ප්‍රංශ මහා ලේඛක වික්ටර් හ්‍යුගෝ ය. ඒ 'මනුතාපය' (ලෙමිසරාබ්ලේ) නවකතාවේ ජනවර්ජන හරහා ය.

නවකතා රසයට අමතරව එකල විසූ දරුවන්ගේ ආකල්ප වර්ධනය සඳහා ද මේ උදාර චරිත කිසියම් බලපෑමක් කළේ යැයි අපි සිතමු. එවැනි චරිත අනුකරණය කිරීමේ කැමැත්තක්, ආශාවක් දරුවකුගේ සිත්සතන් තුළ වගා-දිගා කිරීම පන්සිල් කටපාඩම් කරවීමට වඩා අර්ථසම්පන්න වීමට ඉඩ ඇතැයි අපට සිතෙයි.

'විජයබා කොල්ලය' යනු ත්‍රිත්වයන්ගේ එකතුවකි. එය ඩබ්ල්යු. ඒ. ද සිල්වා සූරීන්ගේ තුන්වන ඓතිහාසික නවකතාවයි. (සෙසු නවකතා වන්නේ දෛවයෝගය හා සුනේත්‍රායි) චමත්කාරජනක ලෙස නවකතාව ඉදිරියට ඇදී යන්නේ ද තුන්කොන් ප්‍රේමයක් සමඟයි. කතාවේ ජාතීන් තුනක් නියෝජනය වන අතර ඔවුහු බෞද්ධ, ක්‍රිස්තියානි හා ඉස්ලාම් වශයෙන් ආගම් තුනක් නියෝජනය කරති. ජයවර්ධන පුර සීතාවක හා කන්ද උඩරට රාජධානි කතාවට පසුබිම් වී තිබේ.

ඩබ්ල්යු. ඒ. සිල්වාගේ පොතපත කියවීමෙන් ලැබූ රසය, ආස්වාදය එකල අපට ලබා දුන් අනෙක් ලේඛකයා වන්නේ කරුණාසේන ජයලත් ය. ටී. බී. ඉලංගරත්නයන්ගේ ඇතැම් නවකතා ද එකල අපට කියවීම සඳහා බොහෝ සෙයින් උත්තේජනය ලබාදී තිබේ.

මේ කාරණය හොඳින්ම දැන සිටින විදග්ධයෝ පවා දැන් ඒ ගැන (මේ ලේඛකයන් ගැන) ප්‍රසිද්ධියේ කතාකරන්නට මැලි වෙති. ඇතැම්විට ඒ විද්වතුන් ලෙසත් සම්මතව සිටින ඇතැමුන් සාහිත්‍යවේදිකාවේදී මේ ලේඛකයන්ගේ නම හෝ මතක් නොකරන්නට පරිස්සම් වීම නිසා විය හැකි ය. පසුගිය දිනෙක මා ප්‍රකට පුවත්පත් කලාවේදිණියක සමඟ සිංහල නවකතාව ගැන කතාකරමින් සිටියදී ඇය මා සමඟ කීවේ මෙවැනි කතාවකි.

'ඉස්සර අපි කොච්චර ආසාවෙන් කරුණාසේන ජයලත්ගේ නවකතා කියෙවුව ද? ඒවා බොළඳ වුණත්'

'කරුණාසේන ජයලත්ගේ නවකතා බොළඳ වන්නේ ඇයි' දැයි මම ඇගේන ප්‍රශ්න කළෙමි. ආදරය බොළඳ දැයි දෙවන වරට මා ඇගෙන් ප්‍රශ්න කළේ මුල් ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට ඇය තරමක් කල්වේලා ගත කළ නිසා ය.

ගොළු හදවතේ දම්මි-සුගත් ආදරය බොළඳ වන්නේ නම් 'මළගිය ඇත්තෝ' හි දෙවෙන්දොරා සං-නොරිකෝ සං ප්‍රේමය ප්‍රබුද්ධ හෝ විදග්ධ වන්නේ දැයි අසන්නටය, අනතුරු මට සිතුණේ. ප්‍රේමය පිළිබඳ විශිෂ්ට නිරූපණයක් වන 'මළගිය ඇත්තෝ', 'මළවුන්ගේ අවුරුදු දා' නවකතාවල දෙවෙන්දොරා සං හැසිරෙන්නේ, ක්‍රියාකරන්නේත් හදවතින් මිස බුද්ධියෙන් නොවේ.

අඩසියවසකට පෙර (1962-1965) විජයබා කොල්ලය අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයට නියමිත ග්‍රන්ථයක්ව තිබිණ. 1938 වසරේදී ප්‍රකාශයට පත්වූ මේ අපූරු ඓතිහාසික නවකතාව අගයමින් හක්ගල්ලේ පී.කේ.ඩී. සෙනෙවිරත්නයන් සිළුමිණ පුවත්පතට ලියූ ලිපි පෙළකින් උපුටා ගැනුණ ඡේදයකි යට දක්වෙන්නේ.

> ඵඵෙතිහාසික දැනීම අතින් ඔහු ලද නිවහල් අරටු සම්භාරය ගැන පුදුම විය යුතු තරමිය. විජයබා රජුන් කළ, රටේ තත්ත්වය හමුවේ ඩබ්ල්යූ. ඒ. සිල්වා එදා උපන් ලේඛකයකු සේ සිටී. එදා කොළඹ, සීතාවක, ජයවර්ධන පුරය, කන්ද උඩරට ආදී ප්‍රදේශවල පරිසරය මැවීමේදී කියවන්නාව ලෙහෙසියෙන් එහි ඇතුළු කිරීමට ඔහුට හැකිවී ඇත.

පිටපත් ලක්ෂ ගණනින් විකිණී ඇති 'විජයබා කොල්ලය' නවකතාවේ දැනට මා සතුව ඇත්තේ 2002 මුද්‍රණයයි. එය වර්තමානයට කොතරම් වැදගත් වන්නේ දැයි සිතෙන්නේ ජනවාර්ගික ගැටලුව සම්බන්ධයෙන් ඓතිහාසික වශයෙන් වැදගත් වන අවධාරණයන් ගණනාවක්ම එහි සංගෘහිතව ඇති නිසයි.

පෘතුගීසි ජාතිකයනට මෙන් ම මුස්ලිම් ජාතිකයනටත් කොළොම්තොට සාධාරණ වරායක් හැටියට වෙන් කර තැබීම කෝට්ටේ රජවාසලේ නියමය වුණත් පෘතුගීසීන් මේ නියමය අමතක කොට ඉඩ ලැබුණු තැන මුස්ලිම් ජාතිකයන්ගේ ගේදොර කොල්ලකමින් රටේ කලහ ඇති කළ අයුරු පෙන්වා දෙන 'විජයබා කොල්ලය' මුස්ලිම්වරු වෙළෙඳාමෙහි අතිසූරයන් වූ බව ද අවධාරණය කරයි. සිංහලයින් දීර්ඝ කාලයක පටන්ම මුස්ලිම්වරුන් ද සමඟ දැහැමි ලෙස ගනුදෙනු කළ අතර පෘතුගීසින්ගේ සැහැසිකම් නිසාම බොහෝ විට (සිංහලයන්) භාණ්ඩ සැපයීම කළේ මුස්ලිම් ජාතිකයන්ටම බව එහි වැඩිදුරටත් අවධාරණය කෙරෙයි.

> මුස්ලිම්වරුන් හට මේ ප්‍රයානයන්හිදී සංඝයාගේ ද පිහිට ලැබුණේය. මුස්ලිම්වරුන් ප්‍රතිකාල් වරුන් මෙන් ස්වකීය ලබ්ධිය රටේ වගා කිරීමට හෝ රට පාලනය අවුල් කිරීමට හෝ සැහැසිකම් කිරීමට හෝ වෑයමක් නොකළහ. එහෙයින් තමන්ගේ පාඩුවේ වෙළෙඳාම පමණක් කළ ඔවුනට සංඝයාගේ ද උපකාර ලැබුණු හෙයින් ඒ මගින් අධිපති ජනයා අවනත කරගැනීම අපහසු නොවීය.
>
> *(විජයබා කොල්ලය - 16 වන මුද්‍රණය - 33 පිටුව)*

කිසිදු ප්‍රචාරකවාදී ප්‍රයත්නයකින් තොරවම 'විජයබා කොල්ලය' නම් වූ මේ අපූරු නවකතාව ජාතික සමගිය සඳහා පසුබිමක්-අවකාශයක් ද සපයා දී තිබේ. ආයතනික මට්ටමින් මේ රටේ මර්මස්ථානවල සිටින්නන් කවර අභිදානයන් ලබා ඇතත් නැතත් ඉතා අඩු තරමින් පොත් කියවීම හෝ ප්‍රගුණ කර සිටියේ නම් (ඔවුන්ගේම වචනයකින් කිවහොත්) සංහිඳියාව සඳහා ජාතික සමගිය උදෙසා විජයබා කොල්ලයේ එන මේ ඓතිහාසික සාහිත්‍යයික අවධාරණයන් කොතරම් අපූර්වාකාරයෙන් ප්‍රයෝජනයට ගත හැකිව තිබිණි ද? මනුෂ්‍යත්වයේ ප්‍රභේද වටහාගැනීමට මෙන්ම ජාතීන් අතර හොඳහිත හා විශ්වාසය වර්ධනය කිරීම සඳහාත් සතර අතින් කවුළු විවර කරන 'විජයබා කොල්ලය' වැනි වජ්‍ර පුස්තකයක් ප්‍රයෝජනයට නොගැනීම අවාසනාවක් නොවන්නේ ද?

කැත්ලීන් ජයවර්ධන